**කොවිඩ් 19 සති පාසල**

**සබරගමුව**

**විෂය - භූගෝල විද්‍යාව**

**සතිය - 02 සතිය** **ශ්‍රේණිය - 9 ශ්‍රේණිය** **වාරය - III වාරය**

**ඒකකය - ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම්**

**පැවරුම අංක -02**

**ක්‍රියාකාරකම -02** - ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය පවතින විවිධත්වය හඳුනා ගනිමු.

**හැඳින්වීම** - සංවර්ධනය එකම රටක් තුළ වුවද ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ.ශ්‍රී ලංකාවේද ප්‍රාදේශිය වශයෙන් සංවර්ධන මට්ටම් වල වෙනස්කම් දක්නට ලැබේ.මෙම වෙනස්කම් එක් එක් දර්ශක ඇසුරින් හඳුනා ගැනීම මේ සතියේ ක්‍රියාකාරකම මගින් ආවරණය වේ.

**පියවර අංක - 1**- 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොතේ පිටු අංක 70-73 දක්වා සාවධානව කියවා ගන්න.

**පියවර අංක - 2** ඒ ඇසුරින් පහත ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන්න.(පෙර උපදෙස් අනුව )

**ප්‍රශ්නාවලිය**

01. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව කුටුම්භ ආදායම සැළකීමේදි මාසික කුටුම්භ ආදායම වැඩිම දිස්ත්‍රික්ක 3 ලියන්න.

02. ලෝක බැංකු වාර්තාවට අනුව 2015 දි ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතිකය ලියන්න.

03. ශ්‍රී ලංකාවේ ළදරු මරණ අනුපාතිකය අඩුම හා වැඩිම දිස්ත්‍රික්ක පිළිවෙලින් නම් කරන්න.

04. ශ්‍රී ලංකාවේ උපතේදි ආයු අපේක්ෂාව ස්ත්‍රි,පුරුෂ වශයෙන් වෙන් වෙන්ම දක්වන්න.

05. ස්ත්‍රින්ට සාපේක්ෂව පුරුෂයන්ගේ ආයු අපේක්ෂාව අඩු වීමට හේතු ලෙසට ඔබ සිතන්නේ මොනවාද ?

පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව ඉහළම අගයක් වාර්තාවන දිස්ත්‍රික්ක 3 ක් නම් කරන්න.

07.නාගරික,ග්‍රාමීය,වතු අංශ අනුව සාක්ෂරතා අනුපාතය ලියා දක්වන්න.

**පසු වැඩ -** දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකාවේ ඉහළ සාක්ෂරතා අගයන් වාර්තා වේ.මීට හේතු දක්වමින් ලිපියක් සකස් කරන්න.